**කැගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 14 - 2022**

---

## 1. විගණන මතය

1.1 කැගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 14ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 කැගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 14 කට අදාලව නිකුත් කර තිබුණු විගණන වාර්තා 14 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති ඇතුළුව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| කාරක සභාව/කාරක සභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| රුවන්වැල්ල, බටුවත්ත, අරණායක, පනාවල | ක්ෂය ප්‍රතිශත මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | කාරක සභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රුවන්වැල්ල, පින්නවල, දැලිවල, උස්සාපිටිය | වටිනාකම රු.34,904,195 ක් වූ ජර්නල් සටහන් 111 ක් සඳහා අනුමැතියක් නොතිබුණි. (ඇමුණුම -1 ) | ජර්නල් සටහන් සඳහා අනුමැතිය ලබා ගනිමි. ඉදිරියේදී නිවැරදි කරමි. | ජර්නල් සටහන් සඳහා අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | රුවන්වැල්ල | ණයහිමි ලේඛනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට රු.610,400ක් වූ ණයහිමි ශේෂ 02ක් පැවැතිය ද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එවැනි ශේෂ නොතිබුණි. | ණයහිමි උපලේඛනයේ මුද්‍රණ දෝෂයකින් එම වරද සිදු වී ඇත. | ණයහිමි ලේඛන නිවැරදිව පවත්වාගෙන යා යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | යටිටෝගොඩ | ගොවීන්ගේ සුභසාධක අරමුදලින් ප්‍රතිපූර්ණය කර ගැනීමේ අරමුණින් වියදම් කළ රු.592,258ක් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | ඉකුත් ව්‍යාපෘති සඳහා ගෙවීමට තිබුණු නිසා එම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකිය. | අදාළ මුදල ප්‍රතිපූර්ණය කරගත යුතුය. |
| (ඈ) | යටිටෝගොඩ | මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 වර්ෂයේ සිට පවතින රු.2,707,992 ක අවිනිශ්චිත හර ශේෂය නිරවුල් කර නොතිබුණි. | එම අවිනිශ්චිත ගිණුම පියවා ඉදිරියේදී සංශෝධිත ගිණුම් වාර්තා සකස් කරමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතු වේ. |
| (ඉ) | පින්නවල | ණයට ගැනුම් වටිනාකමක් ගිණුම්වල සටහන් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ ගැනුම් හා ණයහිමියන් රු.132,050 බැගින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට නිවැරදි කරමි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඊ) | පින්නවල | ණයගැති ලේඛනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂයට වඩා රු.159,300ක් වැඩියෙන් එදිනට එම ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ණයගැති ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රභව ලේඛන, මූල්‍ය ප්‍රකාශන සමග සැසඳිය හැකි විය යුතුය. |
| (උ) | දැලිවල | 2021 වර්ෂයේ නිසි පරිදි වෙන් කිරීම් ඇති නොකිරීම නිසා එම වර්ෂයට අදාළව ණයහිමියන්ට කළ රු.464,350 ක ගෙවීමක් 2022 වර්ෂයේ ලාභයට එරෙහිව ලියාහැර තිබුණි. | ඉකුත් වර්ෂයේ ගැණුම්, ගැණුම් ලෙජරයට ඇතුළත් නොවීම නිසා මෙම වර්ෂයේ වියදමක් ලෙස සටහන් කර ඇත. | ඒ ඒ වර්ෂයන්ට අදාළව වෙන්කිරීම් සිදුකළ යුතුය. |
| (ඌ) | උස්සාපිටිය | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පැවැති රු.319,310ක් වූ විවිධ ණයහිමි ශේෂ 18ක් හා ගෙවිය යුතු විදුලිය හා දුරකථන ගාස්තු රු.14,883ක් සමුච්චිත අරමුදලට ගලපා පොත්වලින් ඉවත් කර තිබුණි. මේ සඳහා කමිටු තීරණයක් පමණක් තිබුණු අතර, ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ හෝ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගෙන් අනුමැතිය ලබාගන්නා බව කාරුණිකව දන්වා සිටිමි | පොත්වලින් ඉවත් කිරීමේදී විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. |
| (එ) | උස්සාපිටිය | ගොවි සංවිධාන 02 කට ණයට භාණ්ඩ විකුණා තිබුණ ද, ඒවා ගිණුම්ගත නොවීම නිසා වර්ෂයේ විකුණුම් හා ණයගැතියන් රු.135,845ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි. | ණයගැති ලේඛනයට ඇතුළත් කරන බව දන්වා සිටිමි. | ණයට විකුණුම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | අරණායක | සමාලෝචිත වර්ෂය තුළ මුදලින් සිදු කළ | වර්ෂය තුළ අය වි | මුදල් ප්‍රවාහ |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.1,441,756 ක ගනුදෙනු 04ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | වර්ෂය තුළම ගෙවා ඇති බැවින් එම ශේෂ මුදල් ප්‍රවාහයට ඇතුළත් නොකරන ලදි. | ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඔ) | දැරණියගල | මුදල් රෙගුලාසි 264 ට පටහැනිව, අවස්ථා 4 ක දී සිදු කළ රු.190,770 ක ගෙවීම් තහවුරු කර ගැනීමට සාක්ෂි නොවුණි. | එම වවුචර් සඳහා බිල්පත් අමුණා නිවැරදි කළ බව කාරුණිකව සඳහන් කරමි. | සියලු ගෙවීම් සඳහා තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඕ) | බැමිණිවත්ත | පොදු ලෙජරයේ ණයගැති ගිණුමට සිදුකර තිබුණු එකතුව රු.751,115ක හර හා බැර ගැලපීම්වල නිවැරදිතාව තහවුරු කර ගත නොහැකි විය. | අතපසුවීමකින් ජර්නල් සටහන් තබා නොමැති අතර එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| කාරක සභාව/ කාරක සභා | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| රුවන්වැල්ල | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර ණයගැති ගිණුම | 2,351,304 | 2,166,322 | 184,982 | බිත්තර වී ණයට විකුණුම් වැරදි ලෙස ලෙජරයට ගැනීම. | පොදුලෙජරයේ ශේෂ හා ශේෂ පිරික්සුමේ ශේෂ සමාන විය යුතුය. |
| අරණායක | වෙළඳ අලෙවිය<br>කෘ.ප.නි.ස ණයගැති ගිණුම | 1,631,175<br>280,835 | 1,711,020<br>363,230 | 79,845<br>82,395 | දෛනිකව පොත්වල ඇතුළත් කරන විට මාරුවීම් සිදු වී ඇත. | පොදුලෙජරයේ ශේෂ හා ශේෂ පිරික්සුමේ ශේෂ සමාන විය යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| කාරක සභාව/ කාරක සභා | විෂය | මුදල<br>රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| යටිටෝගොඩ | ජංගම නොවන වත්කම් | 2,707,992 | වසර 10 | මෙම අවිනිශ්චිත ගිණුම පියවීමට කටයුතු කරමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |
| | ජංගම වගකීම් | 32,429 | වසර 10 | පිළිතුරු නැත | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |
| උස්සාපිටිය | බැර ශේෂය | 12,661 | වසර 5 | මේ සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගනිමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |
| දැලිවල | ජංගම වත්කම් | 4,900 | වසර 5 | මෙම ශේෂය සොයා බලා නිවැරදි කරමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |

### 1.4 නීති,රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| කාරක සභාව/ කාරක සභා | නීති, රීති , රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රුවන්වැල්ල, පරගම්මන, දැරණියගල, යටියන්තොට, දැලිවල, බටුවත්ත, පනාවල, අඹේපුස්ස | (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත<br>(i) 52 (1) වගන්තිය | සෑම වගා කන්නයකටම පෙර බල ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ 52 (1) අනුව කටයුතු කළ යුතුය. |
| රුවන්වැල්ල, යටිටෝගොඩ, යටියන්තොට, දැලිවල, බටුවත්ත, දැදිගම පනාවල, අඹේපුස්ස | (ආ)1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ චක්‍රලේඛය | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, දීර්ඝ කාලයක සිට පැවත එන 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කාමර කුලී රු.1,183,793ක් විය. | තොරතුරු සොයාගත නොහැකි වීම නිසා අයකරගත නොහැකි වී තිබුණි. | කාමර කුලී චක්‍රලේඛය අනුව අයකර ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| බැමිණිවත්ත<br>දැරණිගල<br>අඹේපුස්ස,<br>උස්සාපිටිය,<br>බැමිණිවත්ත<br>පනාවල,යටියන්තොට<br>යට්ටෝගොඩ,<br>දැරණියගල<br>පරගම්මන,<br>රුවන්වැල්ල<br>පින්නවල ,බටුවත්ත<br>දැදිගම, දැලිවල | (ඇ) 2020 ජූනි 25 දිනැති අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | ඇප තැබිය යුතු ගොවිජන සංවර්ධන නිලධාරි, මධ්‍යස්ථාන ලිපිකරු හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 336 දෙනෙකු විසින් ඇප තැබීම් සිදුකර නොතිබුණි. | අවශ්‍ය උපදෙස් ලද පසු අදාළ චක්‍රලේඛය පරිදි ඉදිරියේදී කටයුතු කරමි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ . |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය හා ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයත් එහි වර්ධනය/ පිරිහීම පහත දැක්වේ.

| ගොවිජන සේවා කාරක සභාවේ නම | මෙහෙයුම් ප්‍රතිඵලය | | මෙහෙයුම් ප්‍රතිඵලයෙහි වර්ධනය/ (පිරිහීම) |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | |
| | රු. | රු. | රු. |
| පරගම්මන | 1,175,975 | 501,998 | 673,977 |
| යට්ටෝගොඩ | (349,574) | 559,198 | (908,772) |
| දැදිගම | 195,793 | 299,496 | (103,703) |
| අඹේපුස්ස | 225,902 | 399,608 | (173,706) |
| බටුවත්ත | 547,311 | 406,036 | 141,275 |
| පින්නවල | 582,066 | 1,204,050 | (621,984) |
| දැලිවල | 36,913 | 902,128 | (865,215) |
| උස්සාපිටිය | 552,376 | 455,234 | 97,142 |
| අරණායක | 352,482 | 112,433 | 240,049 |
| රුවන්වැල්ල | 1,382,600 | 1,508,218 | (125,618) |
| දැරණියගල | 462,610 | (31,175) | 493,785 |
| යටියන්තොට | 377,552 | 365,228 | 12,323 |
| පනාවල | 1,364,545 | 306,431 | 1,058,114 |
| බැමිණිවත්ත | 1,764,934 | 1,660,368 | 104,566 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| යට්ටෝගොඩ | දෛනික වැටුප් මත සේවයේ යොදාගත් සේවිකාවකගේ සේවය නතර කිරීම මත කාරක සභාවට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් රු.636,080 ක් වන්දි ලෙස ගෙවීමට සිදු වී තිබුණි. | එවැනි මුදලක් කාරක සභාවට ගෙවීමට සිදුවිය. | රජයේ නීති, රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| බැම්ණිවත්ත | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 65 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් රු.356,127ක් 2022 වර්ෂයේදී වැයකර තිබුණි. ඉන් රු.282,680ක් පමණක් ප්‍රතිපූරණය සඳහා දිස්ත්‍රික් කාර්යාලයට යොමුකර තිබුණු අතර, 2023 මාර්තු වනවිටත් එම මුදල් ලැබී නොතිබුණි. 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (xvi) ඡේදය පරිදි රාජ්‍ය ආයතන මඟින් පවත්වන උත්සව සඳහා රාජ්‍ය මුදල් භාවිතා නොකරන ලෙස දන්වා තිබූ කාල වකවානුව තුළ මෙම උත්සවය පවත්වා තිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/3/2/65-ANIVERSERY/22 හා 2022.09.29 දිනැති ලිපියට අනුව කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| පින්නවල, අඹේපුස්ස, පනාවල, අරණායක, රුවන්වැල්ල | අවසන් තොග තුළ පැළ, කෘෂි උපකරණ , කෘෂි රසායන, බීජ හා පොහොර යටතේ රු.904,588ක කල් ඉකුත් වූ තොග පැවතිණි. | එම තොග පොත්වලින් හා ගබඩාවෙන් ඉවත් කිරීමට 2023 වර්ෂයේදී කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| අරණායක, උස්සාපිටිය, දැරණියගල, | 2021 යල කන්නය සඳහා නොමිලේ බෙදාහැරීමට ලද දියර පොහොර ලීටර් 827 ක් සහ | නියමිත කාලය තුළ දී පොහොර නොලැබීම ඊට හේතුව විය. | නියමිත කාලයට අවශ්‍ය පොහොර බෙදා හැරිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| යටියන්තොට | පොහොර කිලෝග්‍රෑම් 16529ක් 2023 පෙබරවාරි වන විටත් ගබඩාවේ රඳවා තිබුණි. | | |

## 3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| බැම්ණිවත්ත, දැලිවල, බටුවත්ත, අඹේපුස්ස, උස්සාපිටිය, යටියන්තොට, අරණායක, රුවන්වැල්ල, දැරණියගල, පනාවල, පින්නවල, යට්ටෝගොඩ, | දීර්ඝ කාලයක සිට අයකර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.14,682,675 ක් වූ ණයගැති ශේෂ 192 ක් 2022 දෙසැම්බර් 31 දින වනවිට අයකර ගැනීමටත් එකතුව රු.11,911,161 ක් වූ ණයහිමි ශේෂ 207 ක් නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය උපදෙස් ලබාගෙන මෙම ශේෂ නිරවුල් කිරීමට හා තොරතුරු සනාථ කර ගැනීමට නොහැකි වීම මත පවතින ශේෂ කපා හැරීමට කටයුතු කිරීමටත්, අනෙකුත් ශේෂ පිළිබඳ සොයා බලා නිවැරදි කිරීමටත් පියවර ගැනීම. | හිඟහිටි ණය ශේෂ නොපමාව අයකර ගැනීමටත්, ණයහිමි ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතු වේ. |
| දැදිගම පරගම්මන බැම්ණිවත්ත, අඹේපුස්ස, පින්නවල | විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘ.ප.නි.ස නිලධාරීන් වෙත ලබා දෙන භාණ්ඩවලට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන් 92 දෙනෙකුගෙන් රු.3,513,516ක් ලැබිය යුතුව පැවති අතර, ඉන් 51 දෙනෙකු හට ලබා දෙන ලද භාණ්ඩ වෙනුවෙන් රු.2,192,450 ක් වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර කාලයක් ගත වී තිබුණද, පියවා නොතිබුණි. විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබා දෙන ද්‍රව්‍ය සඳහා මුදල් පියවීමට නිශ්චිත කාල සීමාවක් ද හඳුනාගෙන නොතිබුණි. | වැටුපෙන් අයකරගැනීමට කටයුතු කෙරේ. | හිඟහිටි ශේෂ නොපමාව පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| යටියන්තොට | යුධ හමුදාව විසින් 1992 වර්ෂයේදී රැගෙන ගිය පිරිවැය රු.1,066,845ක් වූ ට්‍රැක්ටර්යක් හා ට්‍රේලරයක් ආපසු ලබා ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව තොරතුරක් සොයා ගත නොහැකි නිසා ගිණුම්වලින් ඉවත් කිරීමට නොහැකි වී ඇත. | අදාළ වත්කම් ආපසු ලබා ගැනීමට පියවරගත යුතු වේ. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල ,පිරියත හා උපකරණ

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අරණායක | 2021 වර්ෂයේ ඉදිකළ පිරිවැය රු.256,000 ක් වූ “පොලිටනලය” සහ “සෙවන ගෘහය” විගණිත දින වූ 2023 අප්‍රේල් 21 දින වනවිට ඌන උපයෝජිතව පැවතුණි | මෙම වත්කම්වල නඩත්තු කටයුතු බහුකාර්ය සංවර්ධන නිලධාරින් වෙත පවරා ඇත. ඒ තුළ වගා කිරීමට කටයුතු කරමි. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |
| දැදිගම | සති පොළ පැවැත්වීම සඳහා මධ්‍යස්ථාන භූමියේ ඉදිකර තිබුණු ගොඩනැගිල්ල වර්ෂ 03ක පමණ කාලයක සිට අභාවිතව පැවතුණි. | නව අලෙවිසැල් ඉදි වීම නිසා මෙම සතිපොළ වෙත ගොවින්ගේ පැමිණීම අඩු වී තිබේ. ඒ නිසා වෙළඳුන් මෙහි භාණ්ඩ අලෙවියට පැමිණීම ප්‍රතික්ෂේප කර තිබුණි. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය.- |
| යටියන්තොට | ට්‍රැක්ටරයක අලුත්වැඩියාවකින් අඩක් නිමකර රු.187,600ක ඉතිරිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය අනුමැතිය සඳහා ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත යොමුකර තිබුණ ද, 2023 අප්‍රේල් මාසය වනවිටත් එම මුදල් නොලැබීම නිසා ට්‍රැක්ටරය තවදුරටත් ගරාජයක රඳවා තිබුණි. | ට්‍රැක්ටරය අලුත්වැඩියාව සඳහා ගෙවීම් කිරීමට ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ අනුමැතිය ලද පසු සිදුකිරීමට අපේක්ෂා කරමි. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |
| යටිටෝගොඩ | සභා භූමියේ වූ කෑගල්ල දිස්ත්‍රික් ගොවිජන පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වසර කිහිපයක සිට අබලන්ව**,** නිෂ්කාර්යව පැවැතිණි. | මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියාව සඳහා ගිවිසුම් අත්සන් කර ඇති අතර, ඉදිරියේ දී එය භාවිතා කිරීමට කටයුතු කෙරේ. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| පරගම්මන, රුවන්වැල්ල, අඹේපුස්ස, පින්නවල, පනාවල, බැම්ණිවත්ත, යටියන්තොට, දැලිවල | සභා බල ප්‍රදේශ 08ක පැවැති කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් 320 න් 2022 දෙසැම්බර් 31 දිනට වසම් 99 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ පුරප්පාඩු පැවැති අතර, එම | මේ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා දැනුවත් කර ඇත. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

පුරප්පාඩු පැවති කාලය වසර 02 ත් වසර 05 ත් අතර කාල පරාසයක විය.

## 4. ගොවිජන බැංකු

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අඹේපුස්ස, පරගම්මන, යටිටෝගොඩ, පින්නවල, පනාවල, දැදිගම, උස්සාපිටිය, බටුවත්ත, දැලිවල, අරණායක, දැරණියගල | ණයලාභීන් 1537 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂය රු.56,130,220 ක් වූ අතර එම ශේෂය තුළ කිසිදු වාරිකයක් නොගෙවූ ණයලාභීන් 227 දෙනෙකුගෙන් රු.15,178,006 ක් අයවිය යුතුව පැවැතිණි. | හිඟ ණය අයකර ගැනීමට; සැලැසුම් සකස් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීම, ශේෂ කපා හැරීමට උපදෙස් ඉල්ලීම, ණයගැතියන් ලිඛිතව දැනුවත් කිරීම ආදී කටයුතු ඉටුකර තිබුණි. | හිඟ හිටි ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |